## 365 බලව් බලව් කුරුසේ

බලව් බලව් කුරුසේ – එල්ලෙන ජේසු අනේ
තුවාල මුළු සිරුරේ – උල්පත් සැනසීමේ
කුරුසේ ගැලවීමේ – කුරුසේ ජීවිතයේ
කුරුසේ උත්ථානේ – වැළැඳ ගනිමු කුරුසේ

අත්මිටි පහරින් ඇන්නෝ
මූහුණට කෙළ ගැසුවෝ
අල්ලෙන් කම්මුල් තැළුවෝ
වට කැරැ ගත් සතුරෝ

පිට එක හැටියේ හැවෝ
පිට දිගටමැ හැවෝ
කස පහරින් පිට පැළුවෝ
සිරුරේ සුව නැසුවෝ

උල් කටු වළල්ල සිරසේ
ඔබ එ හිර කෙරුවෝ
උල් කටු මසටමැ කැව්වෝ
ලෙයින් මුහුණ තෙමුවෝ

එළියක් කුරුසෙන් දිස්වේ
ලෝකෙට ආලෝකේ
ඔබ වෙතැ අප ඇදැ ගත්තේ
ගිව්සුම සළක ඔබේ